" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/PTR/2-4/FI/6(E)  ඔබේ අංකය / உமது இலக்கம் / Your No.  දිනය / திகதி / Date 2023.01.20

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/උතුරු මැද/උතුරු/නැගෙනහිර/සබරගමුව/ඌව/මධ්‍යම/දකුණු, පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් අධ්‍යාපන ,සංස්කෘතික හා කලා කටයුතු,ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමේ ලකුණු පටිපාටිය සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2023.01.04 දිනැති ලිපිය හා බැදේ.ඒ අනුව එම ලිපියෙන් ප්‍රසිද්ධ කර තිබූ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ ලකුණු පටිපාටිය ඇමුණුම 01 හි දක්වා ඇති පරිදි සංශෝධනය වන බව කාරුණිකව දන්වමි.

02. උක්ත ලිපියේ ලකුණු පටිපාටිය හැර සෙසු කරුණු නොවෙනස්ව පවතින අතර මේ වන විට අයදුම්පත් යොමුකර ඇති හා යොමු කිරීමට අපේක්ෂිත සියළු අයදුම්කරුවන් සංශෝධිත ලකුණු පටිපාටියට යටත් වන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

03.මේ පිළිබඳ ඔබ යටතේ සිටින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

**ඩබ්ලිව්.ටී.ඒ.මානෙල්**
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

**අත්/කළේ :- ප්‍රදීප් යසරත්න**
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதிப் பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට අදාල ලකුණු පටිපාටිය

| මාතෘකාව | උපරිම ලකුණු |
|---|---|
| **ජ්‍යෙෂ්ඨත්වය**<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් වීමෙන් පසු එක් වසරකට ලකුණු 05 බැගින් ( උපරිම වසර 10 ක් දක්වා ) | 50 |
| **ක්ෂේත්‍රයේ/ක්ෂේත්‍ර වල පළපුරුද්ද**<br><br>**01.අධ්‍යාපන සංවර්ධනය**<br>අධ්‍යාපන සංවර්ධනය සඳහා සිදු කරන ලද ව්‍යාපෘති එකකට ලකුණු 02 බැගින් ව්‍යාපෘති 05ක් සඳහා උපරිම ලකුණු 10 (මෙම ව්‍යාපෘති විධිමත් අනුමැතියක් සහිතව නිලධාරියා සෘජු දායකත්වයක් දක්වා ඇති ව්‍යාපෘති විය යුතු අතරම ව්‍යාපෘති වාර්තාව සහ කාළ රාමුව ඇතුලත් විය යුතුය.)<br><br>**02.අධ්‍යාපන පරිපාලනය**<br>I. අධ්‍යාපන පරිපාලන සේවයට පත්වීමෙන් අනතුරුව විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති වරයෙකු වශයෙන් අවම වසර 01ක් සහිතව උපරිම වසර 02 ක් සඳහා ලකුණු 02<br><br>II. අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් අවම වසර 01ක සේවා කාලයක් සහිතව උපරිම ලකුණු 08<br><br>• අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වසර 1 ක් සඳහා - ලකුණු 02 බැගින්<br><br>• නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ<br>වසර 1 ක් සඳහා } - ලකුණු 01 බැගින් | 20 |

<table>
<tr>
<td>
වෘත්තීය සුදුසුකම් / පර්යේෂණ නවෝත්පාදන<br><br>
(1) අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම්<br>
(අදාළ සේවා ව්‍යවස්ථාවේ/ බඳවා ගැනීම් පටිපාටියෙහි විශේෂයෙන් දක්වා ඇති ක්ෂේත්‍ර/ විෂයයන් අතරින් අදාළ ක්ෂේත්‍රය තෝරන්න)<br><br>
a) පර්යේෂණයක් සහිත පශ්චාත් උපාධිය - ලකුණු 7<br>
b) පශ්චාත් උපාධිය (පර්යේෂණ රහිත) - ලකුණු 6<br>
c) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 4<br>
d) උපාධි/ පශ්චාත් උපාධි සහතික - ලකුණු 2<br><br>
(2) පර්යේෂණ හා නවෝත්පාදන (වෛකල්පික - අදාළ නම් පමණක් ඇතුලත් කරන්න)<br><br>
a) අදාළ ක්ෂේත්‍රය තුළ පේටන්ට් බලපත්‍ර / ප්‍රකාශන හිමිකම් සහිත නවෝත්පාදන/ නවීකරණ - ලකුණු 10<br>
b) ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළ වූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියවුණු පර්යේෂණ නිබන්ධන - ලකුණු 6<br>
c) පිළිගත් අධ්‍යාපනික සඟරාවක පළවූ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලියැවුනු පර්යේෂණ නිබන්ධන - ලකුණු 05<br>
d) වැඩ වපසරිය තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලද නව්‍යකරණ / තොරතුරු තාක්ෂණික සැකසුම් සංවර්ධනය - ලකුණු 04 (ලේඛන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි)<br><br>
(3) අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය තුළ පුහුණුව<br><br>
(උක්ත පුහුණුව අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ විෂයානුබද්ධ පුහුණුවක් විය යුතුය,අදාල නිලධාරියාගේ පත්වීම හා රාජකාරියට අදාල විය යුතුය,එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය.)<br><br>
a) මාස 3ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 1<br>
b) දින 10ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.5<br>
c) දින 03ක හෝ ඊට වැඩි කාලයක - ලකුණු 0.2<br><br>
(4) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව<br>
a) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් / ලකුණු 6.5 ක හෝ ඊට වැඩි සමස්ථ කාර්ය සාධනයක් සහිත IELTS සාමාර්ථය / 2013 හෝ ඊට වැඩි TOEFL-CBT හෝ TOEFL-PBT හෝ ඊට වැඩි ලකුණු 02
</td>
<td>10</td>
</tr>
</table>

| | |
|---|---|
| b) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ රජයේ පුහුණු ආයතනයකින් ලබා ගත් ඉංග්‍රීසි භාෂා සහතික පත්‍රය -ලකුණු 01<br><br>❖ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | |
| **ප්‍රබලතා/ශක්තීන්**<br>**කාර්යය සාධන වාර්තා ආසන්න වසර 05 (උපරිම ලකුණු 05)**<br><br>a)කාර්යය සාධන ඇගයුම සතුටුදායක - ලකුණු ½ බැගින්<br><br>b)කාර්යය සාධන ඇගයුම සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල හෝ ඊට වැඩි ලකුණු 01 බැගින්<br><br>**තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලා (උපරිම ලකුණු 03)**<br><br>(එම පුහුණුව පළාත් හෝ ජාතික මට්ටමේ රජය විසින් පිළිගත් ආයතනයකින් හදාරා තිබිය යුතුය )<br><br>a) මාස 03-06 අතර පාඨමාලා - ලකුණු 02<br>b) මාස 06ට වැඩි අතර පාඨමාලා - ලකුණු 03<br><br>**අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය (උපරිම ලකුණු 02)** | 10 |
| **<u>චර්යාත්මක නිපුණතා</u>**<br><br>අයදුම්කරු විසින් දැනට සේවය කරනු ලබන සේවා ස්ථානයට අදාලව ආයතනයේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තුවන සංවර්ධන වැඩපිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඪ පිටපතක් ඉදිරිපත් කල යුතු අතර ,තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් Power point presentation ඇසුරෙන් සිදු කළ යුතුය.ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br>I. කාල කළමණාකරණය - ලකුණු 2 ½<br>II. සන්නිවේදන කුසලතාවය - ලකුණු 2 ½<br>III. අන්තර්ගතය (අයතනයේ අරමුණු,යෝජනා) - ලකුණු 2 ½<br>IV. සමස්ථ ඉදිරිපත් කිරිම - ලකුණු 2 ½ | 10 |

සටහන 1- ඉහත ලකුණු පටිපාටියේ "පිළිගත් විශ්ව විද්‍යාලයක්" ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබ ඇති විශ්ව විද්‍යාලයකි.

සටහන 2 - ඉහත ලකුණු දීමේ පටිපාටියේ සඳහන් කර ඇති සියළු පශ්චාත් උපාධි සුදුසුකම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඒවා විය යුතු අතර උපාධි ප්‍රදානය කරන වෙනත් ආයතන වලින් ලබාගත් එවැනි සුදුසුකම් වේ නම් ඉහත කොමිෂන් සභාවේ පිළිගැනීම ලද ඒවා විය යුතුය.

දිනය: .......................................